# නිර්මාණ Nirmana

## රණබිමේ පුතුන් වෙතටයි !

රණබිමේ පෙරමුණේ අවි දරා අණ කරන
පුතනුවෙනි, අපෙ වීර සිහළ රුධිරය දරන
සපු කුමරු එදා යාපා පටුන ජය රැගෙන
පැමිණි ලෙස එන්න! ඔබ ජය කෙහෙළි නංවමින

ඔබේ ශක්තිය තමා දැයේ මුළු ජීවයම
දැස ඔබ වෙත යොමා සිටී අද මුළු රටම
සියොතුනේ ගී ගයව් රණ විරුන් සඳ හාම
මඳ පවන හමනු මැන විඩා නිවමින් සැම

වීරයින් ඔබ වගේ එදත් සිටි නිසාමයි
මෙතෙක් රැකුණේ රටයි ජාතියයි ආගමයි
පුතුනි ඔබ ඉපදුණේ අපේ පෙර පිනටමයි
හෙළ විකුම් පාන ඔබ ජාතියේ ජීවයයි

රට නිසා නොවෙද ඔබ දිවා රෑ වෙහෙසෙන්නෙ
ගැමුණු හෙළ වීරයා පෑ විකුම් සිහිවන්නෙ
සූර කොබ්බෑකඩුව නාමයත් පවතින්නෙ
කිසිවිටක හෙළ පුතුන් නොමැත පසුබට වෙන්නෙ

සතුරු බළ ඇණි හෙලන රුදුරු ගිනි නිවේවා!
නපුරු සිතුවිලි ඔවුන් හදෙහි නූපදීවා!
කෙසරු වන් අබිරු බල හෙළ පුතුට ලැබේවා!
මිතුරු දම මල් විලස මුළු ලකෙහි පිපේවා!

*විශ්‍රාම ලත් විදුහල්පතිනිය*
♦ ***ප්‍රේමා අදිකාරි***
Morden, Surrey, **UK**

## වැඩවර්ජකයාගේ බිරිඳ

ඇකේ බිළිඳාය තන කිරි හිඳි ලාය
පිලේ හිමිඳාය ඔහු වැඩ වර ලාය
කුසේ ගිනිලාය අතමිට නැතු වාය
මරණ තුනක් රැක ගැහැණිය පැණි කැය

♦ ***ශ්‍රියා කුමාරසිංහ***
**New Zealand**

## අක්කරු සිත

ලොවත් නිසංසලයි සිතත් අසුන්දරයි
නිමක් නැති කතා බොහෝ කියයි
මමත් මෙතැන හිඳ - ඔබත් ඔතැන හිඳ
තෙරක් නැති දේ සිතයි
කලක් දුක් වින්ද ඔබ මා
යළිත් නොතැවෙයි සිතෙයි
එතෙක් ඉමු අපි බිඳුණු විලසට
සිත් නොබිඳී තියෙයි
කොතෙක් සිතුවද පලක් නැති දේ
මතකයට එබෙයි
යළිත් එතැනම ඉන්ද වී අප
ඒ ගැනම සිතයි
බැඳුම් නැති සිත අයාලේ යයි
ඒ අතින් වරදයි
මටත් සිතෙනව ඔබට වාගෙම
සිතට විලංගු වැටුණයි

♦ ***ධම්මිකා තෙන්නකෝන්***
**Nicosia Cyprus**

## පුතුනි මගේ!




සුවඳ රැඳි
ඔබ කුටියේ
දැස වසා
හුදකලාවී සිටිමි
මොහොතකට මම
පුතු ගැනම
සිතෙයි මට

ළඟ නොමැති කල ඔබ
දැනේ දුක නිරතුරුවම
සිතයි තුරුළට ගෙන ඔබ
සිපගන්නට පෙර ලෙසින් ම

දුරු රටක ඔබ සිටිය ද
හඬ ඇසේ අබියස මා දෙසවන
නොදැනේ කුමක්දෝ කියා පුත
සිත හිරිවැටී යයි විගසම

කඳුළු නැගේ දෙනෙතට
ඔබ උණුසුම ළඟ නොමැති කල
එනමුදු පුතේ ඔබහට
නිරතුරුවම පතමි මම
බුදුසරණ!

♦ ***අජිතා පින්සිරිනි රණවීර***
රොස්මිඩ් පෙදෙස **Colombo 7**



ගිය මසට යෙදුණු මහා නළු
ගාමිණී ෆොන්සේකා මහතාගේ
සිව්වැනි අනුස්මරණ දිනය වෙනුවෙනි

## රංගන තක්සලාවේ මහඇදුරු

සිනමා ලොවේ ජීවය රැඳි මිණිපාන
විරු චරිතයෙන් කළ දස්කම් අසමාන
නොමියන මතකයකි සවිමත් කබලාන
අද කොහි සැඟවුණිද සිත් බැඳි නළුවාන

අරුතක් දෙමින් හෙළ සිනමා කලා වට
සක්විති වුණා රංගන තක්සලා වට
සිනමා ලොවට උරදී යළි නැගී මට
කළ මෙහෙවරට තුති පුදදෙමි සදා වට

රංගන කලාවට ඔබ නම් රජෙකු සමයි
සිනමා අඹරෙ ගුරුතරුවත් ඔබම තමයි
සිරිලක් දැයට දෙවියන් දුන් පඩුර ඔබයි
රහසෙම නැතිව ගිය සිනමා කිරුළ ඔබයි

♦ ***ප්‍රියංවදා ජයමාලි***
මුවගම රත්නපුරය **Sri Lanka**

## දෙව්යෝ!

වැදූ මවත් උතුම්
දිනූ දැයත් උතුම්
සුරකින පා විකුම්
පුතේ නුඹත් උතුම්

පිපී සුවඳ කුසුම්
අගයයි වීරකම්
දැසින් මම දුටිමි
දෙවියෝ සිටි වරම්

***රන්ජිත් විමලනාත්***
**Paris, France**

## ජීවිතයේ හරය

මෙත් සිතකින් තැවෙන සිතක්
නලවන්නට පුළුවන්නම්
කුළුනු හදින් හඬන හදක්
සනසන්නට පුළුවන්නම්
මුදු ඇසකින් තෙමුන ඇසක්
වියලන්නට පුළුවන්නම්
ජීවිතයේ හරය එයයි
මිනිසත් කම බබලවනා

දුක් කෙඳිරිලි සවන යොදා
හඳුනන්නට පුළුවන්නම්
රිදෙන කයක් මුදු පහසින්
පිරිමදින්න පුළුවන්නම්
අන් දුක ගැන නැණ නුවනින්
යොමුවන්නට පුළුවන්නම්
ජීවිතයේ හරය එයයි
මානව යුතුකම් රැකෙනා

යුතුකම් වෙත හිත යොදවා
ඉටුකරන්න පුළුවන්නම්
තමාව අමතක කරලා
පරහට සෙත සලසයි නම්
තම අයිතිය නියම විලස
විඳගන්නට පුළුවන්නම්
ජීවිතයේ හරය එයයි
සදා නිවන ලැබගන්නා

♦ ***මධුරි අබේවික්‍රම***
**Harrow UK**

## නියඟයට හසුවූ වියපත් තුරක් තුරුණු තුරක් දැක

ඉපල් යුග මානාන
ඉසිඹුලන හද ඇතිව
අව් කූටකෙන් දැවෙන
තුරුණු තුරු දියණියේ

නියං ඉස්සරින් දා
නිම් නැතිව රැඳු මුත්
නියං සායට තවම
කෝඩුකාරයෙකි නුඹ

තුරුණු රූ සපුවෙ හැඩ
මල් පොකුරු සුදු හලන
මියෙන හැටි බල බලා
විහඟ කැල දුර ගියා

අදර ගී මුමුණමින්
තුරුණු වත පිරිමදින
රොන් සොයන සහළාන
අපට තව බෝ දුරයි

සැඩ හිරුත් ඔච්චමින්
නුඹට සුව ගෙනෙන සේ
තව තවත් සිප ගනී
කිරිකෝඩු මුව කමල

***දුලාංජලි සිරිවර්ධන***
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
**Sri Lanka**

## මගෙ දේවි

ඔසරි පොටේ මල් නැතුවට
මල් පිපි උයනකි නුඹෙ සිත
කඳුනැඟුනට ජීවිතයේ
සැරයටියකි නුඹෙ අත මට

ආදර සෙනෙහස අරගෙන
ජීවිතයම පාටකරන
නුඹ මුරගල විය ආදර
සඳකඩ පහනක තනියට

♦ ***නිශ්ශංක***
***හපුආරච්චි***
**Sri Lanka**

## ආදර අම්මා!

මෝරනා සඳ විලස සිත මව්
සෙනෙහෙ ලියලා වැඩෙන් නේ
සිතෙහි දාහය නිවන සිහිලැල්
සුළං මෙන් සුව ගෙනෙන් නේ
රාහු ගිලගත් සඳ ලෙසින් මරු
වෙතට ඔබ ගිය සැටි අනේ
අහෝ! ඔබ අප හැමට දුක් දී
ඇයිද අපගෙන් වෙන් වුණේ

දානෙ සාදන පොහෝ දින
පන්සලට යන ඔබෙ රුව පෙනේ
සිල්හි පිහිටා දහම් සුවයෙන්
බුදුන් නමදින හැටි පෙනේ
බෝ මළුවෙ හිඳ බවුන් වඩමින්
නෙත් පියා උන් හැටි පෙනේ
මව් සෙනේහෙට ලියන දුක් ගී
කොතෙක් ලියුවත් මිදි අනේ

දිරිය නැණ කරුණාව මෙසියල්
කිරට මුසුකර පොව මිනේ
දිවි මගෙහි දුර යන්න දරුකැල
යොමු කළේ ඔබෙ මව් සෙනේ
ඔබෙ වියෝගය මහා ගින්නක්
ලෙසින් හෝගා ඇවි ලුණේ
මහා සයුරෙහි රුවල් බිඳි
නෞකාව ලෙස අප තනි වුණේ

පහන් තරුවක් වෙමින් අප දිවි
එළිය කළ බව සිත මිනේ
පණස් වසරක් ගෙවුණ මුත් ඔබ
ගුණ සුවඳ නැත වියැකුණේ
තනිව හිඳිනා හැම වෙලාවෙම
ඔබේ රුව මැවි මැවි පෙනේ
පතන්නෙමු මතු මතුත් ඔබ
අපෙ මැණියන් වේවයි අනේ!

♦ ***රත්නාවලි කුමාරි***
***දිසානායක***
Hounslow Middx **UK**

## ආයාචනා

සොහොයුර සොයුරියෙනි මෙහි සේවය කරන
මව්බිම ගැන යමක් ඇත දැන් පව සන්න
දිව රෑ නොබල අප දේශය රැක ගන්න
වෙහෙසෙන වීරයින් ගැන සිත් යොද වන්න

අත් පා අහිමි වූ විරුවන් යුදට වැදී
අසරණ වෙලා පිහිටක් ගැන බලා හිඳී
රැකගමු ඔවුන් ජීවිත පරවෙන්න නොදී
කරනට යමක් අප හා එක්වන්න බැඳී

අහිතක් නැතුව ඒ බව අරගෙන සිතට
උපකාරයක් කර ඔවුනට හැකි ලෙසට
දායක වන්න හෙළබිම මිනිසෙකු ලෙසට
ඔබෙ යුතුකමයි එය ලක්මැණිගෙ නමට

♦ ***විමලා යාපා*** (ඇඹිලිපිටිය)
**Nicosia**
**Cyprus**

## රන් කරල් කිරුළ

උපාධියේ ඔටුන්න බිම තබන් නේ
රන්කරලේ ඔටුන්න හිස තබන් නේ
අත කරගැට කඳුළුවලට නොදෙන් නේ
පුරන් කුඹුරු අස්වද්දා දිනන් නේ

රැකියාවට පෝලිම්වල නොයන් නේ
මවයි පියයි ඇස් දෙක සේ රකින් නේ
මගේ පුතා රටක් වටියි කියන් නේ
දැත දෙපා වීරිය තව වැඩෙන් නේ

♦ ***ආර් ඒ සෝමරත්න***
**Sri Lanka**

## පන්හිඳ ඇත මගෙ තනියට

ගණඳුර මකා සඳ අහසේ නැග එද්දී
තරුවක් පුංචි ඒ ළඟ තනියට ඉද්දී
සීතල පවන් මා වත සිපගෙන යද්දී
පත්ඉරු පුරා කවි සීපද ලියැවෙද්දී

පිච්ච මල් සුවඳ මා වට දැවටෙද්දී
කලාමැදිරි එළි දස අත විහිදෙද්දී
තනිකම මගේ සිත පුරවාගෙන යද්දී
පන්හිඳ මගේ තනිකම මකවා ලද්දී

තනි යහනෙහිදි මා නෙතු පියවී එද්දී
සිහිනෙන් රැයෙහි නුඹ මා වෙතටම එද්දී
ඇරුණා දැස නුඹ මා වෙත ළං වෙද්දී
හැබැහින් දුක පමණි නුඹ ඇතක ඉද්දී

♦ *මාරවිල* - ***ඈන් ප්‍රියාංගනී***
**Nicosia Cyprus**

## එංගලන්තයේ කඨින පිංකමක්

එංගලන්තයේ ලෙච්වර්ත් වල තිබෙන
රාහුල හාමුදුරුවෝ අධිපති ලෙසින
සිටිනා පන්සලෙහි මහ ඉහළින් කෙරුණ
දුටුවෙමි කඨින පින්කම ජනයා පිරුණ

ලෙච්වත් පළාතේ ලංකා පිරිස හැම
එක් රොක්වුණා හිරුරැස් වැටෙනා විටම
කංචන, අරුණ, රාමා සහ සිටි සැවොම
බොදු කොඩි මලින් සැරසිලි කෙරුවා කදිම

කඨින සිවුර කවුරුත් වටවී මහලා
හංස වාහනය සෙනෙහේ තිබු හදලා
ධාතු කරඬුවත් එහි තැන්පත් කරලා
කඨින චීවරය රවි හිසමත තියලා

නිම කළ මල්වලින් වෙහෙරක් කරේ තියා
හේවිසි හඬ පිරිත් නාදය පැතිර ගියා
කුඩ කොඩි සේසත්ද මල් මිටි කරේ තියා
දරුවන් කුඩා, වැඩි හිටියන් පෙරට ගියා

පෙරහැර මැදින් වැඩියා හාමුදුරු වරු
පැතිරුණි සාදු නාදය දස අත මියුරු
සුදු ජනයාට වෙසෙනා එපියස නුදුරු
විස්මිත දෙයක් විය ඉන් පෙර නුදුටු විරූ

දානය සාංඝික ඉහළින් පිරි නැමුවා
කඨින චීවරය සිරිතට පුද කෙරුවා
කඨිනෙහි අනුහස්ද සදහම් පද ඇසුවා
සිය ගණනක් සෙනග දවසම ගත කෙරුවා

ෂෙරින් ෂාමලී චමිලා සුහා යන
ජයමින් ටානියා දුෂ් එකතුවී ගෙන
වෙහෙස මහන්සිය කාගෙත් නිවා ලන
රැසුවුණ හැමට රස බොජුනක් බෙදා දුන

රවී මුල්ව හිතවත් අය එකතු වෙලා
වැදගත් පින්කමක් මැනවින් ගෙවෙනු බලා
රාහුල හාමුදුරුවන් සිත සතුටු වෙලා
කාටත් නිවන් පතමින් වැඩ ඉවර කළා

♦ ***ප්‍රේමා එස්. රූපසිංහ***
**London E6**



## ප්‍රාර්ථනා !

මිදෙමින් මව්පියන්ගෙන් යුද පිටිය වෙත
දිවගියෙ දරන්නට මව්බිම රකින තැත
මරණය එතත් කම් නැත දිවි පුදන සිත
මා තුළ එදා තිබු බව මට මතක ඇත

සුන්දර යොවුන් විය අමතක කර දමලා
දහසක් පැතුම් සුළඟට පාකර දමලා
සිහිසන් නොමැති ගිනි අවි දෙඅතින් දරලා
පෙරමුණ වෙත ගියෙමි රුදු සතුරන් හඹලා

පන්හිඳ පත් ඉරුව වෙත හුරු මගෙ සුරත
අවියට යොමුවුණා දන්නෙහිද හිතවත
දැන් ඒ ගැන සිතා තැවිලා පලක් නැත
දිරිගෙන සිනාසෙමි කිසිවක් නොවුණු ලෙස

හද තුළ පැතුම් යුද ගිනි වැද අළු වෙනවා
ආදර සිතුම් ඒ තුළ වැනසී යනවා
සිහිවී ඇයව නෙතු කඳුලැලි මතු වෙනවා
අබාධිත නමුත් සිත දිරිමත් වෙනවා

සාමය උදාවෙයි ලක්බිම සදා සෙත
පොපිමල් පිපෙයි රණවිරුවන් සොහොන් මත
ලක්මව සුරැක තව අවුරුදු දහක් වෙත
හෙට මියගියත් හිතවත මට කමක් නැත!

♦ **ර. සෙ. පරණවිතාන PSN**
**7 ශ්‍රීලංකා සිංහ රෙජමේන්තුව**
**රණවිරු සෙවන**
**රාගම Sri Lanka**

**පාඨක ඔබටයි**
**මෙම නිර්මාණ පිටුවේ පළකිරීම සඳහා ඔබේ කවි පංති එවන්න. ඒවා කෙටියෙන් ලියන්න.**